ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

AA3 විභාගය - ජනවාරි 2019

## (AA34) ක්‍රියාවලීන්, පාලනයන් සහ විගණනය

(Processes, Controls and Audit)

---

(AA34) ක්‍රියාවලීන්, පාලනයන් සහ විගණනය ප්‍රශ්න පත්‍රය ස්ව-අධ්‍යයන පොත මත පදනම් වූ අනිවාර්ය ප්‍රශ්න නවයකින් යුක්ත විය. ප්‍රශ්න පත්‍රය කොටස් තුනකි; **A කොටස** ලකුණු 5 බැගින් වූ ප්‍රශ්න 4 කින්ද, **B කොටස** ලකුණු 10 බැගින් වූ ප්‍රශ්න 3 කින්ද, **C කොටස** ලකුණු 25 බැගින් වූ ප්‍රශ්න 2 කින් ද වශයෙනි.

සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයම ස්ව-අධ්‍යයන පොතේ න්‍යාය සහ යෙදුම් මත පදනම් විය. අයදුම්කරුවන් ස්ව-අධ්‍යයන පොත අධ්‍යයනය කර තිබුනේනම් සහ අඩු ගණනේ ඉකුත් වර්ෂ 5 ට අදාල පසුගිය ප්‍රශ්න පත්‍රවලට උත්තර ලියා පුරුදු පුහුණු වී තිබුණේනම් ඔවුන්ට ලෙහෙසියෙන්ම මෙම ප්‍රශ්න පත්‍රය සමත්වීමට අවශ්‍ය ලකුණු 50 ට වඩා ලබාගත හැකිව තිබුණි. පරීක්ෂකවරුන්ට පෙනී ගියේ අයදුම්කරුවන් බොහොමයකට විෂය දැනුම තිබුණ නමුත්, විෂය කරුණු මත පදනම්ව උත්තර විධිමත්ව සකස්කර ගැනීමේ පරිචය ඔවුන්ට නොතිබූ බවයි.

මෙම ප්‍රශ්න පත්‍රය සඳහා අයදුම්කරුවන්ගේ උත්තර ලිවීමේ සමස්ත කාර්යසාධනය එතරම් සතුටුදායක මට්ටමක නොවූ අතර, ලකුණු 75 කට වැඩියෙන් ලකුණු ලබා ඇත්තේ අයදුම්කරුවන් ස්වල්ප දෙනෙකු පමණි. ඒ ඔවුන් වෙන් කල කාලය මැනැවින් කළමනාකරණය කරගෙන ප්‍රශ්න පත්‍රයට ක්‍රමානුකූලව උත්තර සැපයීම නිසාය. කෙසේවෙතත්, අයදුම්කරුවන් සැලකිය යුතු ගණනක් ලකුණු 25 කට වඩා අඩුවෙන් උපයා තිබුණේය. අයදුම්කරුවන්ගෙන් බහුතරය ප්‍රශ්න සියල්ලටම වාගේ උත්තර ලියා තිබුණේය. කෙසේවෙතත්, තවත් සමහර අයදුම්කරුවන් ඇතැම් කොටස්වලට උත්තර ලියා තිබුණේ නැත. එසේ වී ඇත්තේ දුර්වල කාල කළමනාකරණය, දැනුම නොමැතිකම, ප්‍රශ්න අවබෝධ කර නොගැනීම නිසා බව පෙනේ.

ඉහත දැක්වූ කරුණු හැර, උත්තර පත්‍ර ඇගයීමේදී දක්නට ලැබුණු පොදු නිරීක්ෂණ පහත පරිදි වේ:

- විශ්ලේෂණ කුසලතා නොමැතිවීම.
- කියවීමට අපහසු අත්අකුරු.
- වැඩි ලකුණු වෙන්කල ප්‍රශ්න සඳහා කෙටි උත්තර සැපයීම.
- අඩු ලකුණු වෙන්කල ප්‍රශ්නවලට දීර්ඝ උත්තර ලිවීම.
- ගැටළු හඳුනාගත් නමුත් ප්‍රශ්නයට අනුරූප වෙමින් උත්තර නොලිවීම.
- උත්තර සැලසුම් නොකිරීම සහ අදාල නොවන දේවල් වලින් උත්තර ලියා නිම කිරීම.
- ප්‍රශ්න පත්‍රයේ දී ඇති **"කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව"** පිළිබඳ උපදෙස් පිළිනොපැදීම.

## <u>A - කොටස</u>

**ප්‍රශ්න අංක 01** (වෙන්කල ලකුණු 05)

ප්‍රධාන පෙළේ මෘදුකාංග සංවර්ධන සමාගමක ව්‍යාපාරයට බලපාන බාහිර පරිසරයේ බලපෑම් පරීක්ෂා කිරීම ප්‍රශ්නයේ අරමුණ වී ඇත. ප්‍රශ්නයේ මුල් කොටස ඍජු එකකි. බාහිර පරිසරයේ ප්‍රධාන බලවේග දෙකක් හඳුනා දැක්වීම එයින් අවශ්‍ය කර ඇත. දෙවන කොටසින්, මුල් කොටසින් හඳුනාගත් බලවේග සාධාරණීකරණය කිරීමේ හැකියාව පරීක්ෂා කර තිබේ.

අයදුම්කරුවන්ගෙන් බහුතරය අවශ්‍යතාවය අවබෝධ කරගෙන නිවැරදි උත්තර ලියා සම්පූර්ණ ලකුණු උපයා ඇත. එනිසා උත්තර ලිවීමේ සමස්ත කාර්යසාධන සතුටුදායක මට්ටමක විය. කෙසේවෙතත්, ප්‍රශ්නයට අදාල නොවූ ඉතාමත් සාමාන්‍ය අන්දමේ උත්තර ලියූ සමහර අයදුම්කරුවන්ට ලකුණු උපයා ගැනීමට හැකිවූයේ නැත.

උදා : විදුලි සංදේශ, මිතුරු පරිසරය, ප්‍රවාහන සේවා, ආදිය.

**ප්‍රශ්න අංක 02** (වෙන්කල ලකුණු 05)

දේපළ, පිරියත සහ උපකරණවලට අදාලව මූල්‍ය ප්‍රකාශන සැදහුම් පිළිබඳව දැනුම පරීක්ෂා කෙරෙන ප්‍රශ්නයකි. ඒ සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක වූ අතර, අයදුම්කරුවන් ස්වල්ප දෙනෙකුට සම්පූර්ණ ලකුණු උපයා ගැනීමට හැකිවිය.

දෙනලද ප්‍රශ්නයට අදාල නොවූ දීර්ඝ ඡේද සහිතව සමහර අයදුම්කරුවන් උත්තර ලියා තිබුණේය. සමහර අයදුම්කරුවන් "පරිපූර්ණත්වය" වැනි එක් සැදහුමක් පිළිබඳව පමණක් සම්පූර්ණ උත්තරය පුරා කරුණු විමසා තිබුණි. එනිසා මූල්‍ය ප්‍රකාශන සැදහුම් පිළිබඳ දැනුවත්භාවය ඉතාමත් දුර්වල මට්ටමක පැවති බව තහවුරු විය.

**ප්‍රශ්න අංක 03** (වෙන්කල ලකුණු 05)

**(a) කොටසින්** සමාගමක විගණනයෙකු ලෙස පත්කල නොහැකි හෝ ක්‍රියාකල නොහැකි තැනැත්තන් පිළිබඳ දැනුම පරීක්ෂා කර තිබූ අතර, **(b) කොටසින්** විගණක ලෙස පත්වීම බාර ගැනීමට පෙර ක්‍රියාවට නැංවිය යුතු පටිපාටි පිළිබඳ දැනුම පරීක්ෂාවට ලක්කර තිබුණේය.

කෙලින්ම යොමුකල ප්‍රශ්නයක් වූ අතර, ඍජු උත්තර ලිවිය හැකිව තිබුණි. **(a) කොටස** සඳහා අයදුම්කරුවන් සැලකිය යුතු ගණනක් නිවැරදි උත්තර ලියා තිබූ නිසා කාර්යසාධනය සාමාන්‍ය මට්ටක තිබුණේය. **(b) කොටස** සඳහා අයදුම්කරුවන්ගෙන් බහුතරය දුර්වල ලෙස උත්තර ලියා තිබූ බැවින් කාර්යසාධනය දුර්වල විය. **(b) කොටසට** උත්තර ලියූ අයදුම්කරුවන් බොහොමයක් ප්‍රශ්නය වරදවා තේරුම්ගෙන තිබූ අතර, සේවයේ යෙදවීමේ ලිපියේ කොන්දේසි වාර්ෂික මහා රුස්වීමේදී විගණක පත්කර ගැනීමේ පියවර යනාදී වැරදි සාමාන්‍ය උත්තර ලියා තිබුණේය.

**ප්‍රශ්න අංක 04** (වෙන්කල ලකුණු 05)

**වත්කම් සාවද්‍ය පරිහරණය** යන්නෙන් කුමක් අදහස් කරනු ලැබේදැයි ප්‍රශ්නයේ **(a) කොටසින්** විමසා තිබුණි.

සමහර උත්තර ඉතාමත් පටු වූ අතර, වත්කම් සොරකම් කිරීම යනුවෙන් යන්තම් සඳහන් කර තිබූ හෙයින් වෙන්කල සම්පූර්ණ ලකුණු ප්‍රදානය කිරීමට තරම් ප්‍රමාණවත් නොවීය. සාවද්‍ය භාවිතය යන්න වෙනුවට බොහෝ අයදුම්කරුවන් සොරකම් කිරීම, පෞද්ගලික වාසිය වැනි පද යොදා තිබුණි.

ප්‍රශ්නයේ **(b) කොටසින්, සීමාසහිත රෝමා සමාගමේ** වංචා අවදානම වැඩි කරන කොන්දේසි / සිද්ධි අයදුම්කරුවන් විසින් හඳුනා දැක්වීම අවශ්‍ය විය. මේ සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක විය. ස්වල්ප දෙනෙකු හැර සියලුම අයදුම්කරුවන් සම්පූර්ණ නිසි ලකුණු ලබාගෙන තිබුණේය. වංචා හා වැරදි වැඩිවීමේ අවදානම පිළිබඳ විෂය දැනුම නිසි පරිදි නැති බව පෙනී ගියද, දී තිබූ සිද්ධිදාමයට අදාල කරුණු නැවත ලියා තිබූ අයදුම්කරුවන්ටද සම්පූර්ණ ලකුණු ප්‍රදානය කෙරුණි.

## B - කොටස

**ප්‍රශ්න අංක 05** (වෙන්කළ ලකුණු 10)

ප්‍රශ්නයේ **(a) කොටස** සහතිකවීමේ කාර්යභාරය පිළිබඳ න්‍යායාත්මක දැනුම පරීක්ෂා කිරීමට යොමුවී තිබුණි. අයදුම්කරුවන්ගෙන් බහුතරය මෙම කොටසට සාර්ථක ලෙස උත්තර සපයා තිබූ අතර, සහතිකවීමේ කාර්යභාරය යනු කුමක්දැයි නිවැරදි ලෙස පැහැදිලි කර සම්පූර්ණ ලකුණු ලබා තිබුණේය.

ප්‍රශ්නයේ **(b) කොටස** යෙදී තිබුණේ සහතිකවීමේ කාර්යභාරයට අදාල ප්‍රායෝගික උදාහරණ හඳුනාගැනීමට අයදුම්කරුවන්ගේ හැකියාව පරීක්ෂා කිරීමටය. අයදුම්කරුවන්ගෙන් සැහෙන ගණනක් පොදු උදාහරණ භාවිත කරමින් උත්තර සපයා තිබූ අතර, කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක තිබුණේය. අයදුම්කරුවන් භාවිත කර තිබූ සාමාන්‍ය පද වූයේ තොග, ණයගැතියෝ, සේවකයෝ, යනාදියයි.

ප්‍රශ්නයේ **(c) කොටසින්, සීමාසහිත සෙක්ටෝස් සමාගමේ** මූල්‍ය පුරෝකතනය මත කුමන වර්ගයේ සහතිකවීමේ කාර්යභාරයක් ඉටුකරනු ලැබේදැයි පරීක්ෂා කර තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් මෙම කොටසට උත්තර ලිවීම නොසලකා හැර තිබූ අතර, උත්තර ලියූ අයදුම්කරුවන්ට සාධාරණ සහ සීමිත සහතිකවීම අතර වෙනස හඳුනා ගැනීමට නොහැකි වී ඇත. බොහොමයක් සඳහන් කර තිබුණේ එය සාධාරණ සහතික වීමක් බවය. එමනිසා මෙම කොටසට උත්තර සැපයීමේ සමස්ත කාර්යසාධනය ඉතාමත් දුර්වල මට්ටමක පැවතුණේය.

**ප්‍රශ්න අංක 06** (වෙන්කළ ලකුණු 10)

ප්‍රශ්නයේ **(a) කොටසේ (i)** යටතේ විගණන පටිපාටි පරීක්ෂා කිරීම හා නිරීක්ෂණය කිරීම වෙනස්කොට දැක්වීම අයදුම්කරුවන්ගෙන් අපේක්ෂා කර ඇත. මෙය තාක්ෂණික මට්ටමේ ප්‍රශ්නයක් වූ අතර, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව විගණන සාක්ෂි ලබාගැනීමේදී භාවිත කෙරෙන්නකි.

ප්‍රශ්නයට උත්තර ලිවීමේ සමස්ත කාර්යසාධනය ඉතාමත් පහළ මට්ටමක තිබූ අතර, ඒ නිසා ඉතාමත් පහළ ලකුණු ලබාගැනීමට ද සිදුවී ඇත.

පරීක්ෂකවරුන් හඳුනාගත් පොදු වැරදි සමහරක් පහත පරිදි වේ:

- සමහර අයදුම්කරුවන් පරීක්ෂා කිරීමේ නිර්වචනය නිරීක්ෂණය කිරීම සඳහා දී ඇත.
- සමහරු පරීක්ෂා කිරීම විගණන පටිපාටි පරීක්ෂාව ලෙස පැහැදිලි කර තිබුණි.
- විගණනය කළ මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කිරීම.
- ගිණුම් එකින් එක පිළියෙල කිරීම.

ප්‍රශ්නයේ **(a) කොටසේ,** අයිතම **(ii)** යටතේ බැංකු සැසැඳුම් ප්‍රකාශනය විගණනය කිරීමේදී ඉටුකළ යුතු විගණන පටිපාටි හඳුනා දැක්වීම අවශ්‍යකරන ලදි. මෙය ප්‍රායෝගික ප්‍රශ්නයක් වූ අතර, අයදුම්කරුවන් තමන්ගේ ප්‍රායෝගික විගණන අත්දැකීම් හා න්‍යායාත්මක දැනුම භාවිත කර උත්තර ලිවීමට සමත් වී තිබුණේය.

අයදුම්කරුවන්ගෙන් බහුතරය ප්‍රශ්නයේ කොටසකට පමණක් උත්තර ලියා තිබුණේය. ස්වල්ප දෙනෙකු පමණක් සම්පූර්ණ ලකුණු ලබාගැනීමට සමත් විය. අයදුම්කරුවන් බොහොමයකට බැංකු සැසඳුම් ප්‍රකාශන විගණනය පිළිබඳ අදහසක් නොතිබූ අතර, ඔවුන් විගණන පටිපාටි ලෙස පහත සඳහන් දෑ පමණක් සඳහන් කර තිබුණේය:

- පරීක්ෂණය.
- නිරීක්ෂණය.
- විමසීම.
- නැවත ගණනය කිරීම.
- කරුණු සොයා බැලීම.

ප්‍රශ්නයේ **(b) කොටසින්** කලින් ගෙවූ කුලී වියදම් විගණනය කිරීමේදී යොදාගත යුතු විගණන පටිපාටි පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම ඉලක්ක කර තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් දී තිබූ සිද්ධිදාමයට යොමු වෙමින් අවශ්‍යතාවයට සරිලන සේ නිසිලෙස සැලසුම්කරගෙන නොතිබුණි. කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතුණේය.

පරීක්ෂක විසින් හඳුනාගත් පොදු සාවද්‍ය උත්තර වූයේ:

- මිල ගණන් කැඳවනු ලැබේදැයි සහතික වීම.
- කලින් ගෙවීම්වල නිරවද්‍යතාවය.
- කලින් ගෙවීම් පිළිබඳ පරීක්ෂණය සහ නිරීක්ෂණ.
- පෙර ගෙවීම්වල නිරවද්‍යතාවය.

## ප්‍රශ්න අංක 07 (වෙන්කළ ලකුණු 10)

**(a) කොටසේ (i)** ප්‍රශ්නය බාහිර සනාථකිරීම් භාවිත කළ හැකි අවස්ථාවලට අදාලය. අයදුම්කරුවන්ගෙන් බහුතරය මෙම කොටසට සාර්ථක ලෙස උත්තර ලියා සම්පූර්ණ ලකුණු ලබා තිබුණේය. කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.

**(a) කොටසේ (ii)** වන ප්‍රශ්නය කළමනාකාරිත්වය විසින් සනාථ කිරීම් ඉල්ලා යැවීම සඳහා විගණකට ඉඩදීම ප්‍රතික්ෂේප කරන්නේනම්, විගණකට ගතහැකි ක්‍රියාමාර්ග ගැන දැනුම පරීක්ෂා කිරීමට යොදන ලද්දකි. අයදුම්කරුවන්ගෙන් බහුතරය මෙම කොටසටද උත්තර ලියා තිබූ අතර, කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතුණේය.

අයදුම්කරුවන් විසින් ලියා තිබූ පොදුවේ වැරදුණු උත්තර පහත සඳහන් විය:

- (සාමාන්‍යයෙන්) බාහිර පාර්ශවයන්ගෙන් අවශ්‍ය තොරතුරු ලබා ගැනීම.
- කාර්යභාරය පැවරීමේ ලිපිය පරිදි ක්‍රියා කිරීම.
- කළමනාකරණයට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීම.

**(b) කොටසින්** විගණන සේවයේ යෙදවීමේ ලිපියක අඩංගු කළ යුතු කරුණු පරීක්ෂාවට ලක්කිරීම ප්‍රශ්නයේ මෙම කොටසින් කර තිබුණි. මේ සම්බන්ධයෙන් අයදුම්කරුවන්ගේ ප්‍රායෝගික මෙන්ම න්‍යායාත්මක දැනුම ඉතාමත් දුර්වල මට්ටමක තිබූ බව පෙනී ගියේය. සේවයේ යෙදවීමේ ගිවිසුමක අන්තර්ගතවිය යුතු සමහර කරුණු ලෙස විගණකගේ තනතුරු නාමය, අදාල වගන්තිය, කාලච්ඡේදය, කළමනාකරණයේ එකඟත්වය සඳහන් විය. මෙම කොටස සඳහා සමස්ත කාර්යාසාධනය සාමාන්‍ය මට්ටමක තිබුණේය.

## <u>C - කොටස</u>

## ප්‍රශ්න අංක 08 (වෙන්කළ ලකුණු 15)

මෙම ප්‍රශ්නයෙන් සිද්ධි අධ්‍යයනයක් දී ඇති අතර, අවදානම් කළමනාකරණ රාමුව යටතේ න්‍යායාත්මක දැනුම පදනම්කොට සහ තොරතුරු තාක්ෂණ පොදු පාලන හා යෙදවුම් පාලන පිළිබඳව ප්‍රශ්න යොමුකර ඇත.

**<u>A කොටස</u>**

ප්‍රශ්නයේ මෙම කොටස අවදානම් කළමනාකරණ රාමුවේ පියවරයන් පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීමට උපදෙස් දී තිබුණි. දීර්ඝ උත්තර ලිවිය හැකි න්‍යාය පදනම් වූ ප්‍රශ්නයක් විය. අයදුම්කරුවන් සැහෙන ගණනක් කරුණු දක්වා තිබුණද, විස්තරාත්මක පැහැදිලි කිරීමක් සපයා තිබුණේ නැත. කාර්යසාධනය පැවතුණේ සාමාන්‍ය මට්ටමකය.

අදාල නොවූ උත්තර වූයේ, උදා: පාලන අවදානම, අඩුවීමේ අවදානම, ඉහළ අවදානම.

## B කොටස

අයදුම්කරුවන්ගෙන් බහුතරය මෙම කොටසට උත්තර සපයා තිබූ අතර, කාර්යසාධනය ඉතාමත් ඉහළ මට්ටමක පැවතුණේ සිද්ධිදාමය අධ්‍යයනය තුලින්ම විස්තර ලබාගැනීමේ හැකියාව තිබූ නිසාය.

## C කොටස

තොරතුරු තාක්ෂණ පාලනයන් යටතේ තොරතුරු තාක්ෂණ සාමාන්‍ය පාලන සහ යෙදවුම් පාලන දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂාවට ලක්කර තිබේ. තොරතුරු තාක්ෂණ වාතාවරණයක් තුළ සාමාන්‍ය පාලන සහ යෙදවුම් පාලන න්‍යායාත්මක දැනුම පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්නය යොමුවී තිබුණි.

මෙම කොටසට උත්තර ලියූ බොහොමයක් අයදුම්කරුවන් සම්පූර්ණයෙන් වරදවා තේරුම්ගෙන තිබූ අතර, ඔවුන් අතුරෙන් බොහෝ දෙනෙකු සීමිත ප්‍රවේශය හෝ අනුමත කළ පුද්ගලයන් පමණි හා භෞතික ආරක්ෂාව වැනි පොදු උත්තර සාමාන්‍ය පාලන සහ යෙදවුම් පාලන යන දෙකටම ලියා තිබෙනු දක්නා ලදී. සමහර අයදුම්කරුවන්, සාමාන්‍ය පාලනයට අදාල කරුණු යෙදවුම් පාලනය සඳහා ලියා තිබුණේය.

ප්‍රශ්නයේ මෙම කොටස සඳහා අයදුම්කරුවන්ගේ සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතුණේය.

## ප්‍රශ්න අංක **09** (වෙන්කළ ලකුණු 15)

## A (a) කොටස

අස්තිත්වයක මූල්‍ය ප්‍රකාශන මත විගණන මතයකට එළඹීමේදී සලකා බැලීමට අවශ්‍ය කරුණු 5 ක් සඳහන් කිරීම අවශ්‍ය විය.

ස්ව-අධ්‍යයන පොත අධ්‍යයනය කර තිබූ අයදුම්කරුවන් අදාල උත්තර ලියා ප්‍රශ්නයේ මෙම කොටසට වෙන්කර තිබූ සම්පූර්ණ ලකුණු ලබා තිබුණේය. ප්‍රශ්නයේ අවශ්‍යතාවයන් වරදවා තේරුම්ගත් සමහර අයදුම්කරුවන් "බීටා පුස්" සමාගමට අදාල කරුණු ලියා තිබුණි.

උදා: රක්ෂණ වන්දි ඉල්ලුම අයකරගැනීමේ හැකියාව:

- විනාශ වූ ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු සම්පූර්ණ කිරීමේ හැකියාව.
- අඛණ්ඩ පැවැත්ම පදනම භාවිත කිරීමේ යෝග්‍යතාවය, ආදිය.

අසාර්ථක වූ උත්තර අතර, පහත සඳහන් වැරදි / අදාල නොවන උත්තර තිබෙනු දක්නා ලදී:

සමහර අයදුම්කරුවන් සහතිකවීමේ යෙදවුමක මූලිකාංග සපයා තිබුණේය.

(ත්‍රිපාර්ශවීය සම්බන්ධතා, විෂය කරුණ, සුදුසු නිර්ණායක, සාක්ෂි සහ සහතික කිරීමේ වාර්තා)

## A (b) කොටස

බීටා පුස් සමාගමේ 2018 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශය ගැන විගණකගේ වාර්තාව කෙරෙහි බලපෑ හැකි වෙනත් බලපෑම් තිබේදැයි තක්සේරු කිරීම අයදුම්කරුවන් විසින් කිරීම අවශ්‍ය විය. අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ගැටළුව පවතිද්දී විගණන වාර්තාකරණය පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම පරීක්ෂක විසින් අපේක්ෂා කර තිබේ. ඒ අනුව, ප්‍රමාණාත්මක අවිනිශ්චිත භාවයක් සිද්ධිදාමය තුළ අනාවරණය වී තිබියදී අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනයක් කිරීම යෝග්‍යදැයි අයදුම්කරුවන් විසින් හඳුනාගැනීම පරීක්ෂක විසින් පරීක්ෂා කර ඇත. එහෙත්, අයදුම්කරුවන්ගෙන් බහුතරය එය නිවැරදිව තේරුම්ගැනීමට අපොහොසත් වී ඇති අතර, කරුණු තහවුරු කිරීමේ ඡේදයක් සහිත විකරණය නොකළ විගණන මතයක් සහිත විගණන වාර්තාවක් ලෙස නිවැරදි ආකාරයෙන් තක්සේරු කිරීමට අපොහොසත් විය.

කෙසේවුවත්, ප්‍රශ්නය නිසිලෙස අවබෝධ කර නොගෙන අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සංකල්පය හා සම්බන්ධ පහත සඳහන් අදාල නොවන උත්තර ලියා ලකුණු ලබාගැනීමට අසමත් වූ අයදුම්කරුවන්ද සිටියහ:

- අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සංකල්පය කළමනාකරණයේ වගකීමකි.
- අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සංකල්පය පිළිබඳ කළමනාකරණයේ තක්සේරුව.
- අඛණ්ඩ පැවැත්ම පිළිබඳව සමාලෝචනය ඉටුකිරීමේදී යොදාගනු ලබන විගණන පටිපාටි.

## B කොටස

ස්වයං ඇල්ම මත තර්ජනය සහ උපදේශන මත තර්ජන යන ඒවා සඳහා උදාහරණ දෙක බැගින් සඳහන් කිරීම මෙම කොටසින් අවශ්‍ය විය. නිසි පරිදි විෂය දැනුම ලබා තිබූ අයදුම්කරුවන් බොහෝ දෙනෙකු මෙම කොටසට නිවැරදිව උත්තර සපයා තිබුණි. සමහරු උදාහරණවලට අමතරව එක් එක් තර්ජනය සඳහා පැහැදිලි කිරීම්ද කර තිබුණේය. තවද අසාර්ථක උත්තර සැපයූ අයදුම්කරුවන් බොහොමයක් ස්වයං ඇල්ම මත තර්ජනය සහ උපදේශන මත තර්ජනය පටලවාගෙන තිබූ අතර, සමහර අයදුම්කරුවන් වෘත්තීය ගණකාධිකාරීන් සඳහා වූ ආචාරධර්ම සංග්‍රහයේ ගෙනහැර දක්වා ඇති මූලික මූලධර්ම හඳුනාගෙන තිබුණේය. මෙම කොටස සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.

## C (a) කොටස

**සීමාසහිත හන්ට් සමාගමේ** බදු උපදේශක වශයෙන් අමතර කාර්යභාරය බාර ගැනීම සම්බන්ධයෙන් **S සහ S** ආයතනය විසින් ඉටු කිරීමට අවශ්‍ය වන පියවරයන් අයදුම්කරුවන් විසින් පැහැදිලි කිරීම මෙම කොටසින් අවශ්‍ය විය. ආචාරධර්ම සංග්‍රහයේ ඇති පියවරයන් සම්බන්ධයෙන් මූලික මූලධර්ම සහ සංකල්පමය රාමුව පරීක්ෂා කිරීම පරීක්ෂකගේ අපේක්ෂාව විය. කෙසේවෙතත්, ඉතා සුළු අයදුම්කරුවන් ප්‍රමාණයක් නිවැරදිව උත්තර ලියා තිබුණේය. වෙනම සේවයේ යෙදවීමේ ලිපියක් අත්සන් කිරීම තුලින් කොන්දේසිවලට එකඟවීම අවශ්‍යයැයි බොහොමයක් අයදුම්කරුවන් උත්තර සපයා තිබුණි. උත්තරවල දක්නට ලැබුණු පොදු වැරදි පහත දක්වා ඇත:

- සමහර අයදුම්කරුවන් **සීමාසහිත හන්ට් සමාගම** පැත්තෙන් ඇතැම් පියවරයන් පැහැදිලි කිරීමට ප්‍රයත්න දරා තිබුණි.
- තවත් සමහරු පැහැදිලි කර තිබුණේ කාර්යභාරය බාරගැනීමෙන් පසු ආදායම් බදු ගණනය කිරීම විය යුතු බවය (තොරතුරු ලබාගන්න, ඉඩදෙනු ලබන සහ ඉඩ නොදෙනු ලබන වියදම් සලකා බලන්න, බද්දට යටත්වන ආදායම ගණනය කරන්න, ගැලපෙන බදු ප්‍රතිශතය යොදාගන්න, ආදී වශයෙනි)

## C (b) කොටස

**S සහ S** ආයතනය විසින් එම ආයතනය ඇතුලත තත්ත්වපාලන පද්ධතියක් පිහිටුවා ඇත්නම්, සේවාදායක සම්බන්ධතා බාරගැනීම සහ දිගටම පවත්වාගෙන යාම අයදුම්කරුවන් විසින් පැහැදිලි කිරීම මෙම කොටසින් අවශ්‍ය විය. තත්ත්වපාලන පද්ධතියේ එක් මූලිකාංගයක් පරීක්ෂාවට ලක් කිරීම පරීක්ෂකගේ අපේක්ෂාව විය. විෂය දැනුම නිසිලෙස ලබාගත් අයදුම්කරුවන් කීපදෙනෙකු හැර සෙසු අයදුම්කරුවන් "තත්ත්ව" යන පදය භාවිත කරමින් පොදු උත්තර ලියා තිබුණේය.

ප්‍රශ්නය පිළිබඳව නිසි අවබෝධයක් නොතිබූ අයදුම්කරුවන් දිශානතිය, සමාලෝචනය වැනි මූල්‍ය ප්‍රකාශන විගණනයේදී අවශ්‍ය කෙරෙන තත්ත්වපාලන අවශ්‍යතාවන් ගැන ලියා තිබුණා මිස ලකුණු උපයාගැනීමට අසමත් විය.

ප්‍රශ්නයේ මෙම කොටස සඳහා උත්තර ලිවීමේ සමස්ත කාර්යසාධනය එතරම් සතුටුදායක නොවූ අතර, අයදුම්කරුවන්ගෙන් බහුතරය වෙන්කර තිබූ ලකුණු 25 න් 30% - 40% ත් අතර ලබා තිබුණේය.

\- - -

**විභාගයේදී උත්තර ලිවීමේ කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා අයදුම්කරුවන්ගේ නිපුණතා මට්ටම ඉහළ නැංවීම සඳහා යෝජනා:**

- අයදුම්කරුවන් ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොත අධ්‍යයනය කොට එහි අන්තර්ගතය මනාව වටහාගත යුතුය.

- විගණන විෂයට සම්බන්ධ ලිපි, පොත්පත්, සඟරා, ආදිය පරිශීලනය කළ යුතුය.

- ප්‍රශ්න පත්‍රයට අමුණා ඇති "කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව" පිළිබඳ නිර්වචන හරිහැටි තේරුම්ගෙන එපරිදි උත්තර ලිවීමට පුරුදු පුහුණු විය යුතුය.

- පසුගිය ප්‍රශ්නපත්‍ර වල අන්තර්ගත දැ අධ්‍යයනය කර, යටත් පිරිසෙයින් ඉකුත් වර්ෂ 5 ක ප්‍රශ්න වලටවත් උත්තර ලිවීමට පුරුදු වී, ප්‍රශ්න දී තිබෙන ආකාරය වටහා ගැනීමට උත්සාහ කළ යුතුය.

- ප්‍රශ්න පත්‍ර වල පරීක්ෂා කර ඇති න්‍යායාත්මක කරුණු යොදා ගැනීම විභාගයේදී පරීක්ෂක විසින් අපේක්ෂා කර ඇත්තේ කෙසේද යන සම්බන්ධතාවය අයදුම්කරුවන් වටහාගත යුතුය.

- ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොතේ කවර ක්ෂේත්‍රවලින් පසුගිය ප්‍රශ්න දී තිබේදැයි කෙටි සටහන් ලියාගැනීම මගින් අයදුම්කරුවන් තේරුම්ගත යුතුය.

- ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවලට කාලය වෙන්කරගෙන ඒ අනුව උත්තර ලියා පුරුදු වීමෙන් විභාගයේදී අයදුම්කරුවන්ගේ කාල කළමනාකරණය දියුණු වනු ඇත.

- ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොතේ එක් එක් පරිච්ඡේදය සඳහා කෙටි සටහන් පිළියෙල කරගෙන විවේක ලැබෙන විධියට විෂය නිර්දේශයේ අන්තර්ගත කරුණු මතකයට නගා ගැනීම සිදුකළ යුතුය.

- අයදුම්කරුවන් කියවීමට හැකි ආකාරයෙන් අත්අකුරු පැහැදිලිව විභාගයේදී ලිවිය යුතුය.

- ප්‍රශ්න පත්‍රයට උත්තර ලිවීම පටන්ගැනීමට පෙර අයදුම්කරුවන් ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් පරික්ෂාකාරිව කියවා බැලිය යුතුය.

- ප්‍රශ්නය නිසිලෙස තේරුම් ගැනීමටත්, ඒවාට අවශ්‍යකරන යෝග්‍ය උත්තර නිවැරදිව ලිවීමටත් පැහැදිලි මානසික ඒකාග්‍රතාවයක් අයදුම්කරුවන් සතුවිය යුතුය.

- වෙන්කර ඇති ලකුණු මත පදනම්ව, ප්‍රශ්නවලට කාලය වෙන්කර ගැනීමෙන් ප්‍රශ්න පත්‍රයේ දී ඇති ප්‍රශ්න වලට ඵලදායී අන්දමින් උත්තර සැපයීමට අයදුම්කරුවන්ට හැකිවනු ඇත.

- ප්‍රශ්න පත්‍රයේ දී ඇති ආකාරයටම උත්තරවලද යෝග්‍ය පරිදි නිවැරදි ලෙස අංක යෙදිය යුතුය.

- න්‍යායයන් හා ඒවා ප්‍රශ්නයට යොදාගැනීම අතර සම්බන්ධය වටහා ගැනීම ඉතාමත් වැදගත්වන අතර, ඉල්ලා ඇති අවස්ථාවන්හි උදාහරණ සහිතව ලිවිය යුතුය.

- උත්තර පොත් බාර දීමට පෙර, අවශ්‍යකරන ප්‍රශ්න සියල්ලටම උත්තර ලියා තිබේද, යෝග්‍ය පරිදි අංක යොදා තිබේදැයි දෙවරක් පරීක්ෂා කර බලන්න.

- * * * -